# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2108/66 – 2019 පෙබරවාරි 01 වැනි සිකුරාදා – 2019.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 1979 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 58 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව කම්කරු කොමසාරිස් ආනන්ද විමලවීර වන මම, වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33 (2) වන වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව ඉහත කී ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2019, පෙබරවාරි මස 22 වැනි දින මධ්‍යහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරෝධතාවයක්ම එසේ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස්.

2019 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

කම්කරු කොමසාරිස් විසින් වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව 1980 ජුනි 26 වැනි දින 94/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද අවසාන වරට 2013.01.22 වැනි දින අංක 1794/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද උපලේඛන පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත I වැනි තීරුවේ සඳහන් කම්කරුවන්හට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| *I වැනි තීරුව*<br>*සේවක පන්තිය* | *II වැනි තීරුව*<br>*වැඩ කරන දවස් සඳහා අවම වේතන ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|
| (අ) පිඹුම්කරු, යන්ත්‍රකරු | 675.00 |
| (ආ) සහාය යන්ත්‍ර ක්‍රියාකරු, බුබුලුකරු, කැපුම්කරු, සහාය පිඹුම්කරු, උදුන්කරු | 600.00 |
| (ඇ) ගිනියම්කරු, මට්ටම් කරන්නා, හුලං ගහන්නා, බර ඇසුරුම්කරු, සහාය බුබුලුකරු | 570.00 |
| (ඈ) කණිෂ්ඨ බුබුලුකරු, හැඩ සමකරන්නා, හරවන්නා, ගණන් කරන්නා | 550.00 |
| (ඉ) කැපුම්කරු, විමිනි කැපුම්කරු, මට්ටම්කරු | 530.00 |
| (ඊ) ඇසුරුම්කරු, ගෙනයන්නා | 500.00 |

02 - 597/1

---

**පඩිපාලක සහා ආඥාපනත**

නිවේදනයයි

**පෙර පාසල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වගන්තිය යටතේ කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 2000 පෙබරවාරි මස 21 වැනි දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය අනුව කම්කරු කොමසාරිස් ආනන්ද විමලවීර වන මම, පෙර පාසැල් සේවා කර්මාන්තයේ නියුක්ත ගුරුවරුන් සහ සහායකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33 (2) වන වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව ඉහත කී ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2019, පෙබරවාරි මස 22 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස්.

2019 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් පෙර පාසැල් කර්මාන්තයෙහි නියුක්ත ගුරුවරු හා සහායකයින්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව කරන ලද 2013 ජනවාරි 22 වැනි දින අංක 1794/11 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *පළමුවැනි තීරය (ප්‍රදේශය)* | | *දෙවැනි තීරය (වෘත්තීය)* | *තුන්වන තීරය (අවම මාසික වේතනය)* |
|---|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (අ) | ගුරුවරුන් | 13,500.00 |
| | (ආ) | සහායකයින් | 11,500.00 |
| නගර සභා සීමාව තුළ | (අ) | ගුරුවරුන් | 12,750.00 |
| | (ආ) | සහායකයින් | 11,000.00 |
| ප්‍රාදේශීය සභා සීමාව තුළ | (අ) | ගුරුවරුන් | 11,250.00 |
| | (ආ) | සහායකයින් | 10,000.00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවට අනුෂාංගික වූ කිසියම් සේවාවක් වේ නම් ඒවා ද ඇතුළත් වේ.

02 - 597/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බීඩි සෑදීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 2015 මැයි මස 27 වැනි දින අංක 1916/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාරව කම්කරු කොමසාරිස් ආනන්ද විමලවීර වන මම, බීඩි සෑදීමේ කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන කැලි ගණන්වලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන් එම ආඥාපනතේ 33 (2) වන වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව ඉහත කී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා පිළිබඳව දැක්වෙන 2019, පෙබරවාරි මස 22 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු සෑම විරෝධතාවයක්ම ලියවිල්ලක් විය යුතු අතර, එම විරෝධතාවයන් දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයන් ද ඊට අඩංගු විය යුතුය.

**ඒ. විමලවීර,**
සභාපති
බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2019 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1957ක් වූ නොවැම්බර් මස 29 වන දින අංක 11208 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින්කල වෙනස් කරන ලද්ද වූ ද අන්තිම වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්ද වූද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වැනි කොටස

කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන්

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ සූදානම් කිරීම, ඔතන කොළ කැපීම, ඔතන කොළ තැබීම, කැපූ එතුම් කොළ ''බීඩි දුම්කොළ'' වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ඇතුළුව) බීඩි එතීම සඳහා කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | *රු. ශත* |
|---|---|
| (*අ*) දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් | 400.00 |
| (*ආ*) දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | 450.00 |
| (*ඇ*) දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් | 490.00 |

කැපූ එතුම් කොළ ''බීඩි දුම්කොළ'' වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ඇතුළුව එහෙත් බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙළ කිරීම සහ ඔතන කොළ කැපීම හැර) බීඩි එතීම සඳහා කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | *රු. ශත* |
|---|---|
| (*අ*) දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් | 300.00 |
| (*ආ*) දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | 340.00 |
| (*ඇ*) දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් | 375.00 |

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙළ කිරීමද ඇතුළුව) ඔතන කොළ කැපීම සඳහා කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | *රු. ශත* |
|---|---|
| (*අ*) දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් | 200.00 |
| (*ආ*) දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | 220.00 |
| (*ඇ*) දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් | 230.00 |

එතූ බීඩි වටා ලේබල් සවි කිරීම සඳහා කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණය බීඩි 1000ට රු. 50.00ක් විය යුතුය.

02 - 597/3

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වෙන විරෝධතා 2019, පෙබරවාරි මස 22 වැනි දින මධ්‍යහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

**ඒ. විමලවීර,**
සභාපති
මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2019 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1946 මැයි මස 24 වන දින අංක 9560 දරන *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබුවාවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්ද වූ ද අවසන් වරට 2013 මාර්තු මස 27 වැනි දින අංක 1803/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II හා III වන කොටස් වෙනුවට පහත දක්වෙන කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.

**II වැනි කොටස**

මත්පැන් හා විනාකිරි කර්මාන්තයේ ඇතැම් කාර්යයන්ට අදාළ වන්නා වූ කෑලි මිම්මේ වැඩට ගෙවිය යුතු අවම වේතන:

| කාර්යය හා ප්‍රමාණයන් | *රු. ශත* |
|---|---|
| පොල් ගස් ඇදීම ‘‘එක් ඇඳුත්තකට’’ | 78.00 |
| කඹ මාරු කිරීම ‘‘එක් ඇඳුත්තකට’’ | 38.00 |
| කඹ කපා අස්කිරීම ‘‘එක් ඇඳුත්තකට’’ | 33.00 |
| පොල් ගස් හැර ඇරීම ‘‘ගස් 110 කට වැඩි නොවන අතුරකට’’ | 3,938.00 |

තැබෑරුම්වලට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීමට:

| | රු. ශත |
|---|---|
| ගාලු දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 61.00 |
| බස්නාහිර පළාතේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 129.00 |
| හලාවත දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 122.00 |
| නුවරඑළියේ හෝ මහනුවර දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| මාතර, යාපනේ හෝ මාතලේ දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 122.00 |
| පුත්තලම, අනුරාධපුර, කුරුණෑගල හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 129.00 |
| බදුල්ල හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| මඩකලපුව හෝ මන්නාරම දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 135.00 |
| කෑගලු දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 90.00 |
| ත්‍රිකුණාමලය හෝ මුලතිව් දිස්ත්‍රික්කයේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 117.00 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස පොල්, කිතුල් හෝ තල් ගස් මැදීමේ කම්කරුවකු ගෙනවිත් දෙන රා ගැලුමකට | 28.00 |
| ස්කාගාරයට හෝ විනාකිරි සෑදීමට රා සැපයීම පිණිස මල් තැලීමට | 3,600.00 |
| පොල්, කිතුල් හෝ තල්ගස් 100කට වැඩි නොවූ විට 100ට වැඩි එබඳු සෑම ගසකට | 38.00 |
| තැබෑරුම්වල රා සැපයීම පිණිස මල් තැලීම - පොල්, කිතුල් හෝ තල්ගස් 25-40 දක්වා | 3,435.00 |

කම්කරුවකු අරක්කු කර්මාන්තය සඳහා හෝ විනාකිරි සෑදීමේ කර්මාන්තය සඳහා හෝ රා මැදීමට යොදවා ගන්නා සෑම විටකම ඔහු විසින් ගෙනවිත් දෙන රාවල ඝන ප්‍රමාණයෙන් 7.5%ක මද්‍යසාර ප්‍රමාණයක් තිබිය යුතුය යන කොන්දේසියට යටත්ව පොල්, කිතුල් හෝ තල්ගස් මැදීම පිළිබඳව පූර්වෝක්ත වේතන ප්‍රමාණය ඔහුට ගෙවිය යුතුය. එසේ වුවත්, එකී රාවල ඝණ ප්‍රමාණයෙන් 7.5% කට අඩු මද්‍යසාර ප්‍රමාණයක් තිබේ නම්, ඉහත කී වේතනයට අනුපාතිකව ඔහුට ගෙවිය යුතුය.

## III වැනි කොටස

මෙහි පහත I වැනි තීරයේ නිශ්චිතව දක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය II වැනි තීරයේ දක්වෙන අනුරූප පඩි ප්‍රමාණයක් විය යුතුය.

යම් මාසයක දී කම්කරුවෙකු අවසර නොමැතිව දින 4 කට වැඩියෙන් නොපැමිණි විට අනුමත නිවාඩු දින 4 ඉක්මවන දින ගණනට, ඔහුගේ මාසික වැටුපෙන් අනුපාතික ප්‍රමාණය අඩුකර ඉතිරි වැටුප ගෙවිය යුතුය.

| I වැනි තීරය<br>කම්කරු පන්තිය | II වැනි තීරය<br>ප්‍රමාණය මසකට |
|---|---|
| *පහත දක්වෙන සේවයේ නියුක්ත වූවන්ට* | *රු. ශත* |
| අතුරු කංකානමගේ වැඩ | 17,130.00 |
| රා තැබෑරුම් කාවල්කාර වැඩ | 14,580.00 |
| අරක්කු තැබෑරුම් කාවල්කාර වැඩ | 14,580.00 |
| අතුරු කාවල්කාර වැඩ | 13,972.00 |
| එකතු කිරීමේ ස්ථානයේ කළමනාකාර වැඩ | 15,675.00 |
| තැබෑරුම්වල රා විකිණීමේ වැඩ | 15,427.00 |
| තැබෑරුම්වල අරක්කු විකිණීමේ වැඩ | 15,427.00 |
| ව්‍යාපාරික අංශයේ (රා ගෙනයාම, රා පීප්ප පැටවීම හා බෑම, ලේහර බාල්දි, ටින් හා වෙනත් භාජන සේදීමේ වැඩ ද ඇතුළුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම | 15,675.00 |

| | |
|---|---|
| ව්‍යාපාරික විනාකිරි අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුලුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම | 14,100.00 |
| ස්කාගාරයේ දී රා පෙරීම | 14,655.00 |
| අරක්කු බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් ඇලවීම | 13,972.00 |
| දර කැපීම හා පැලීම, ස්කාගාරවලදී පීප්ප, බාල්දි හා වෙනත් භාජන ශුද්ධ කිරීම හා සේදීම, අරක්කු ගෙනයාම, පැටවීම, බෑම, අරක්කු මැනීම, රා බෝතල් කිරීම හා ඇබ ගැසීම, විනාකිරි සෑදීම, විනාකිරි බෝතල් කිරීම, ඇබ ගැසීම හා ලේබල් කිරීම, බෙදා හැරීම පිණිස විනාකිරි ගෙනයාම | 13,972.00 |

ව්‍යාපාරික අරක්කු අංශයේ (ගෙනයාමේ වැඩත් ඇතුළුව) පොල්, කිතුල් හෝ තල්ගස්වලින් රා එකතු කිරීම

| | රු. ශත |
|---|---|
| 80ට නොවැඩි ගස් ගණනක් සඳහා | 14,460.00 |
| 81ට නොඅඩු හා 90ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 14,662.00 |
| 91ට නොඅඩු හා 100ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 14,865.00 |
| 101ට නොඅඩු හා 110ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,067.00 |
| 111ට නොඅඩු හා 120ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,270.00 |
| 121ට නොඅඩු හා 130ට වැඩි නොවන ගස් ගණනක් සඳහා | 15,472.00 |
| 131ට නොඅඩු හා ඊට වැඩි ගස් ගණනක් සඳහා | 15,675.00 |

02 - 597/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.